කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

---

No SF-2024-06-T


## වර්ෂ 2024 ජුනි සිට අගෝස්තු දක්වා උෂ්ණත්වය පිළිබඳ අනාවැකිය


**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සෘතුමය අනාවැකිකරන අංශය මගින් 2024 ජුනි 04 වන දින නිකුත් කරන ලදී.**

---

## 2024 ජුනි මාසය සඳහා උෂ්ණත්වය පිළිබඳ සම්භාවිතා පුරෝකථනය

2024 ජුනි මාසය සඳහා ශ්‍රී ලංකාවේ උෂ්ණත්වය පිළිබඳ සම්භාවිතා පුරෝකථනය පහත දැක්වෙන පරිදි වේ.






රූපය **01:** උපරිම උෂ්ණත්වය (දහවල් කාලයේ ) රූපය **02:** අවම උෂ්ණත්වය( රාත්‍රී කාලයේ)


රූපය 01: හි 2024 ජුනි මාසය තුළ ශ්‍රී ලංකාවේ උපරිම උෂ්ණත්වය (දහවල් කාලයේ ) සඳහා සම්භාවිතා පුරෝකථනය දැක්වේ. ඒ අනුව, 2024 ජුනි මාසයේදී මන්නාරම, කුරුණෑගල, ගම්පහ රත්නපුරය, හම්බන්තොට, මහනුවර, නුවරඑළිය සහ මඩකලපුව දිස්ත්‍රික්ක වල උපරිම උෂ්ණත්වය(දහවල් කාලයේ) සාමාන්‍යයට වඩා මඳක් **ඉහල යාමේ** හැකියාවක් ඇති අතර පුත්තලම, බදුල්ල, අම්පාර සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල උපරිම උෂ්ණත්වය මඳක් පහල යාමේ හැකියාවක් පවතී.


රූපය 02: හි 2024 ජුනි මාසය තුළ ශ්‍රී ලංකාවේ අවම උෂ්ණත්වය(රාත්‍රී කාලයේ) සඳහා සම්භාවිතා පුරෝකථනය දැක්වේ. ඒ අනුව, 2024 ජුනි මාසය සඳහා වව්නියාව, මන්නාරම, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුරය, කොළඹ, ගම්පහ, ගාල්ල, රත්නපුරය, හම්බන්තොට, මහනුවර, නුවරඑළිය, බදුල්ල,

ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර යන දිස්ත්‍රික්ක වල අවම උෂ්ණත්වය සාමාන්‍යයට වඩා **ඉහල** යාමේ හැකියාවක් පවතී.

## <u>2024 ජුනි- අගෝස්තු දක්වා උෂ්ණත්වය පිළිබඳ සම්භාවිතා පුරෝකථනය</u>

2024 ජුනි සිට අගෝස්තු දක්වා කාලය සඳහා ශ්‍රී ලංකාවේ උෂ්ණත්වය පිළිබඳ සම්භාවිතා පුරෝකථනය පහත දැක්වෙන පරිදි වේ.






රූපය **03:** උපරිම උෂ්ණත්වය (දහවල් කාලයේ ) රූපය **04:** අවම උෂ්ණත්වය( රාත්‍රී කාලයේ)

රූපය 03: හි 2024 ජුනි සිට අගෝස්තු දක්වා කාලය තුල ශ්‍රී ලංකාවේ උපරිම උෂ්ණත්වය සඳහා සම්භාවිතා පුරෝකථනය දැක්වේ. ඒ අනුව, 2024 ජුනි සිට අගෝස්තු දක්වා කාලය තුල මන්නාරම, අනුරාධපුරය, පුත්තලම, කුරුණෑගල, කොළඹ, ගම්පහ, ගාල්ල, රත්නපුරය, හම්බන්තොට, මහනුවර, නුවරඑළිය සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක වල දිගුකාලීන සාමාන්‍යයය උපරිම උෂ්ණත්වයට වඩා මඳක් උෂ්ණත්වය **ඉහල** යාමේ හැකියාවක් ඇති අතර ත්‍රිකුණාමලය සහ බදුල්ල යන දිස්ත්‍රික්ක වල දිගුකාලීන සාමාන්‍යයය උපරිම උෂ්ණත්වයට වඩා මඳක් උෂ්ණත්වය පහල යාමේ හැකියාවක් පවතී.

රූපය 04: හි 2024 ජුනි සිට අගෝස්තු දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ අවම උෂ්ණත්වය සඳහා සම්භාවිතා පුරෝකථනය දැක්වේ. ඒ අනුව, 2024 ජුනි සිට අගෝස්තු දක්වා කාලය තුල වව්නියාව, මන්නාරම, අනුරාධපුරය, පුත්තලම, කුරුණෑගල කොළඹ, ගම්පහ, ගාල්ල, රත්නපුරය, හම්බන්තොට, මහනුවර, නුවරඑළිය, බදුල්ල, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ අම්පාර යන දිස්ත්‍රික්ක වල අවම උෂ්ණත්වය සාමාන්‍යයය අවම උෂ්ණත්වයට වඩා මඳක් ඉහල යාමේ හැකියාවක් පවතී.

**සටහන: දිගුකාලීන දේශගුණික දත්ත නොමැති වීම හේතුවෙන් කෑගල්ල, මාතර, මාතලේ, මුලතිවු, කිලිනොච්චි, පොලොන්නරුව, මොනරාගල, යාපනය සහ කළුතර යන දිස්ත්‍රික්ක සඳහා උෂ්ණත්ව අනාවැකි මෙහි ඇතුළත් නොවේ.**